**ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**------------------------------------------------------------------------------------------------------------** ශීර්ෂය 163 - අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 දෙසැම්බර් 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,139.36 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,862.49 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,276.87 ක් හෙවත් සියයට 44.30 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | **2016 දෙසැම්බර් 31 දිනට** | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| නරාවර්තන | 853.02 | 827.09 | 25.93 | 3.04 |
| මූලධන | 4,286.34 | 2,035.40 | 2,250.94 | 52.51 |
| **එකතුව** | **5,139.36** | **2,862.49** | **2,276.87** | **44.30** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 32.00 | 31.98 | 20.00 | 24.32 | 100.00 | 86.66 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 46.35 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0092/000 | 1.82 |
| 6000/0000/00/0016/0073/000 | 43.08 |
| 6000/0000/00/0018/0080/000 | 0.75 |
| 6000/0000/00/0002/0124/000 | 0.01 |
| 6000/0000/00/0013/0138/000 | 0.69 |
| එකතුව | 46.35 |

**2.4 විගණන නිරීක්ෂණය**

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන පරිදි ඇප ලේඛනය පවත්වා නොතිබුණු අතර, ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන1.13 ක්වූ තැන්පතු ශේෂයන් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565 (5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරන මාසික තැන්පතු සාරාංශ ඊළඟ මාසය අවසන් වීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශයේ තැන්පත් 05කට අදාළ මාසික තැන්පතු සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 16301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂ තුළ රු.997,100 ක් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වාද රු.391,095 ක් වර්ෂ 05කට වැඩි කාලයක සිටද පැවති අතර එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයෙහි කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට ගැළපීම් කර ඇති රු.1,426,149 ක හඳුනා නොගත් ශේෂ වටිනාකම 2004 වර්ෂයේ සිට පැවත එන අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි වත්කම් පවරා නොගෙන එම වත්කම්වල සිදු කර තිබුණු ඉදිකිරීම් සම්බන්ධව පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශය සතුව 2016 දෙසැම්බර් 31 දිනට සංස්කෘතික මධ්‍යස්ථාන 185 ක් පැවති අතර එයින් මධ්‍යස්ථාන 152 ක් අමාත්‍යාංශයට හිමිකමක් නොමැති ඉඩම්වල ඉදිකර තිබුණි. මෙම ඉඩම්වල නෛතික අයිතිය අමාත්‍යාංශයට පවරා ගෙන නොමැති වීම හේතුවෙන් එම මධ්‍යස්ථානවල පැවැත්ම පිළිබඳ විවිධ ගැටළු මතුවී තිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.මිලියන 1,625.77 ක් වූ අතර, එයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ් 8 (i) ආකෘතියේ රු.මිලියන 513.41 ක් වූ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවිය යුතු බැරකමක් දක්වා ඇතත් එවැනි බැරකමක් සත්‍ය වශයෙන්ම නොපවතිවන බව නිරීක්ෂණය විය.

(ii) වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බැරකම රු.මිලියන 139.54 ක් වුවද එය විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ් 8(i) ප්‍රකාශයේ රු. මිලියන 189.54 ක් ලෙස රු.මිලියන 50 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) මාතර නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ මුළු බැරකම රු. මිලියන 10.11 ක් ලෙස දක්වා තිබුණ ද 2017 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි බිල්පත් අනුව ගෙවීම් රු. මිලියන 10.44 ක් විය. ඒ අනුව රු.මිලියන 0.33 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

## 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | රු.මිලියන | |
| (i) මුදල් රෙගුලාසි 835 (3) | 9.6 | ගොඩනැගිලි කුලියට ගැනීමේ ගිවිසුමක් අත්සන් කිරීමට පෙර එය ඇටෝර්නි |

| | | | |
|---|---|---|---|
| | | | ජනරාල්ගෙන් උපදෙස් විමසා ලිඛිත ගිවිසුම්වලට විශේෂයෙන් ඇතුළත් කලයුතු කරුණු සම්බන්ධයෙන් කටයුතු කළයුතු වේ. නමුත් වයඹ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල කුලියට ගැනීමේදී එකී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 1647 (ආ) | - | අමාත්‍යාංශයේ සියළු වාහනවලට අදාළව සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 1.5 මාර්ගෝපදේශය | 304.4 | රු.මිලියන 5 ක් ඉක්මවන පොදු කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි නිරතවන සියළුම රජයේ නිලධාරීන්ගේ විශේෂ අවධානය 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 8(1), 8(2),9(1) 9(2) හා 12 වගන්තිවලට යොමුකළ යුතු වේ. නමුත් වයඹ ලේකම් කාර්යාලය විසින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ වැඩි දියුණු කළ මාර්ග 24කට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**3.6 කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේ අමාත්‍යාංශය තුළ ඉදිකිරීම් අංශයක් පිහිටුවා තිබුණු අතර මධ්‍යස්ථාන ඉදිකිරීම හා නඩත්තු කටයුතු එම අංශය මඟින් සිදුකරනු ලබයි. එහෙත් 1998 වර්ෂයේ සිට 2016 ජනවාරි 05 දින වනවිට ඉදිකර විවෘත කර තිබූ සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව 185 කි. 2016 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 ක සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් රු.138,310,740 ක් වැය කර ඉදිකර තිබූ සංස්කෘතික මධ්‍යස්ථාන 13 ක් වසර 03 ක් ගතවී තිබුණද 2017 ජනවාරි 05 දින වන විටත් විවෘත කර නොතිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**3.7.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

-------------------------------------------------------------------

මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග 329 කින් මාර්ග 24 ක් වැඩි දියුණු කිරීම සඳහා සීමිත තරඟකාරී ලංසු කැඳවීම් යටතේ මිල ගණන් කැඳවා ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වල්පොල නාථගනේ මාර්ගය වැඩි දියුණු කිරීම**

(i) ගෙවීම් බිල්පතේ වැඩ විෂය අංක 17 යටතේ බැකෝ ලෝඩරයක් දින 12 ක් තුළ වැඩබිමේ යෙදවූ බවට වාරියපොල විධායක ඉංජිනේරු කාර්යාලයේ විධායක ඉංජිනේරු විසින් සහතික කර දිනකට රු.24,000 ක් බැගින් රු.288,000ක් ගෙවීම් කිරීමට සහතික කර තිබුණි .නමුත් 2017 ජනවාරි 11 දින කාර්මික නිලධාරී සමඟ කරන ලද විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම වැඩ විෂයයන් ඉටුකර නොතිබූ අතර බැකෝ ලෝඩරය වෙනුවට Excavator යන්ත්‍රයක් යොදා මාර්ගය සකස් කරමින් තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද අමාත්‍යාංශ ලේකම්ගේ අංක අයිඩබ්සී/02/ එෆ්- 01/07/2017 දරන 2017 ජූලි 14 දිනැති පිළිතුර අනුව එම ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇති බවත් වහාම අදාළ යන්ත්‍රය ඉවත් කර ඒ වෙනුවට බැකෝ ලෝඩරයක් භාවිතා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත් විගණනයට දන්වා තිබුණි.

(ii) උක්ත මාර්ගයට අදාළව වැඩ විෂය අංක 5 යටතේ ABC මිශ්‍රණය ඝණමීටර් 2,200 ක් අතුරා තැලීමට රු.1,601,600 ක් ගෙවීම් සඳහා සහතික කර තිබූ නමුත් ඒවා අතුරන ලද ආකාරය පිළිබඳ මිනුම් පත්‍ර ගෙවීම් බිල්පත් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ගල්වල ගුණාත්මකභාවය )Density) මැනීම සඳහා වූ පරීක්ෂණ BS-812-2-1995 දරන ප්‍රමිතයට සිදුකර නොතිබුණි .

(iv) මාර්ගය වෙත ඇතිරීමට ගෙනවිත් තිබූ ABC මිශ්‍රණය තත්ත්ව පරීක්ෂා කිරීමකින් තොරව වාරියපොල විධායක ඉංජිනේරුගේ වාචික නියෝග මත කොන්ත්‍රාත්කරු ABC මිශ්‍රණය ඇතිරීම කල බවත් කොන්ත්‍රාත්කරුගේ ඉංජිනේරු විසින් විගණනයට කරන ලද ප්‍රකාශනයක් මඟින් තහවුරු කර තිබුණි ඒ අනුව මෙම මාර්ගයට .ABC සැපයීම, ගොනුකිරීම සහ ඇතිරීම සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල රු 6,160,000.ක් වූ අතර ද්‍රව්‍ය නිසි ප්‍රමිතියෙන් යුතු බවට තහවුරු කර ගැනීමට පෙර ගෙවීම් නිර්දේශ කර තිබුණි .තවද මෙම මාර්ගයෙහි කොන්ත්‍රාත් අධීක්ෂණය සිදුකළ වාරියපොල විධායක ඉංජිනේරු කාර්යාලය යටතේ පවතින ද්‍රව්‍ය රසායනාගාරය මඟින්ම පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට ද කටයුතු කර තිබුණු අතර එම වාර්තා ස්වාධීන ආයතනයක් මඟින් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි .

(v) 2017 ජනවාරි 12 දින සිදුකරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී, ඉටු නොකරන ලද වැඩ විෂයයන් 11 ක් වෙනුවෙන් රු.5,472,737 ක් ගෙවීම් කිරීමට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු සහ තාක්ෂණික නිලධාරී විසින් නිර්දේශ කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් වයඹ ලේකම් කාර්යාලය විසින් මාර්ග ඉදිකිරීම් වාරියපොල ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

(i) සෘජු ශ්‍රම පදනම යටතේ වැඩ ඉටු කිරීමේ දී ඊට අදාල ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍රෝපකරණවලට අදාළ පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර භාණ්ඩ මිලට ගතයුතු වුවත් රු 37,630,940.ක්වූ මාර්ග ඉදිකිරීම් 9 කට අදාළව එකී ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ii) ABC වල ගුණාත්මක භාවය පරීක්ෂා කර නොතිබූ අතර ඒවා මාර්ගය වෙත ඇතිරූ පසු තදවීම(compaction) පරීක්ෂා කර නොමැතිව හා පළාත් පාලන ඉංජිනේරුගේ අනුමැතියකින් තොරව මාර්ග 09කට තාර දැමීමට කටයුතු කර තිබුණි.

(iii) මාර්ග රේඛ උපලේඛණය සමඟ වූ ද්‍රව්‍ය පිරිවිතර 1600) SSCM (අනුව මාර්ග ඉදිකිරීම්වල හා ඉදිකිරීමේ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පරීක්ෂා කර බලා ඊට ගෙවීම් කළ යුතු වුවත් එබඳු පරීක්ෂාවකින් තොරව ABC මිශ්‍රණය සහ 1½" කළුගල් ලබාගෙන ඒ සඳහා රු.10,982,260 ක් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි.

(iv) මාර්ගවලට ඇස්තමේන්තු සකස් කිරීමේදී මාර්ගයට ඇතිරූ ගල්වල උස මිලිමීටර් 62 ක් ලෙස සලකා ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් ගල්වල උපරිම උස මිලිමීටර් 5.37ක් විය. එය මිලිමීටර් 62 ක් ලෙස ඇස්තමේන්තු කිරීම නිසා වැඩිපුර ගල් ඝණමීටර් 699 ක් සඳහා රු.1,506,076 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර මුදල් ගෙවීම් කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් හැඳුනුම්පත් 1,000,000 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන35.92 ක් වැය කර තිබුණ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) තාක්ෂණික පිරිවිතරයන්හි ඇතුළත් කාඩ්පතෙහි ආයු කාලය (Security service life) යන නිර්ණායකය අනුව ISO / IEC 24789 තත්ත්වයෙන් තිබිය යුතු බව දක්වා තිබුණි. නමුත් සැපයුම්කාර සමාගමෙහි ප්‍රධානියාගේ අන්තර්ජාල තොරතුරු අනුව එම සමාගමට එබඳු තත්ත්ව සහතිකයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. තාක්ෂණික පිරිවිතරයන්හි ඇතුළත් තත්ත්ව සහතිකය සඳහා එම ලංසුකරු විසින් ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කර නොතිබියදී අමාත්‍යාංශය විසින් මෙම ලංසුව ලංසුකරුට ප්‍රදානය කර තිබුණි.

(ii) තාක්ෂණික පිරිවිතරයන්හි ඇතුළත් කාඩ්පතෙහි අමුද්‍රව්‍ය (Card material) පොලිකාබනේට් හෝ ඊට සමාන විය යුතු බව දන්වා තිබුණි. තවද මේ සඳහා පැවති පූර්ව ලංසු රැස්වීමේදී ද කාඩ්පතෙහි අමුද්‍රව්‍ය සියයට 100 ක් පොලිකාබනේට් විය යුතු බවද ලංසුකරුවන්ට දන්වා තිබුණි. කෙසේ වුවද, සැපයුම්කාර සමාගම විසින් කාඩ්පතෙහි අමුද්‍රව්‍ය සියයට100 ක් පොලිකාබනේට්වලින් යුක්ත බව තහවුරු කර නොතිබුණි.

(iii) තාක්ෂණික පිරිවිතරයන්හි ඇතුළත් කාඩ්පතේ ශක්තිය හා කල් පැවැත්ම යන නිර්ණායක යටතේ කාඩ්පතෙහි සංයුතිය පිළිබඳ ISO / IEC 10373 තත්ත්ව සහතිකය ලබා තිබිය යුතු වුවද සැපයුම්කාර සමාගම විසින් ඒ පිළිබඳ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන කාලසටහනට අනුව 2016 මැයි 07 දින ලංසු කැඳවා 2016 ජුනි 06 දින කොන්ත්‍රාත් ප්‍රදානයට සැලසුම් කර තිබුණි. ලංසු බැඳුම්කරයේ කාලය 2016 ඔක්තෝබර් 20 දින දක්වා පමණක් වලංගු වී තිබුණ ද වලංගු කාලය දීර්ඝ කර ගැනීමකින් තොරව 2017 මාර්තු 01 දින අදාළ සැපයුම්කාර සමාගම වෙත ලංසුව ප්‍රදානය කර තිබුණි.

**3.8 අනාර්ථික ගනුදෙනු**

--------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2016 ජුලි 08 දින සිට විගණිත දින වූ 2017 පෙබරවාරි 08 දින දක්වා වයඹ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල, පළමු මහල හා දෙවන මහල ප්‍රයෝජනයකට නොගෙන අභාවිතව පැවතියද ඒ සඳහා මසකට රු. 455,000 ක් බැගින් මාස 7 ක් සඳහා රු. 3,185,000 ක් කුලී ගෙවා තිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

---------------------------

මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීමට 2003 වර්ෂයේදී සැළසුම්කර ඒ සඳහා මේ වනවිට රු.මිලියන 2.06 ක් වැයකර තිබුණි. එසේ වුවද මෙම මධ්‍යස්ථානය ඉදිකර විවෘත කර එහි ප්‍රතිලාභ ජනතාවට ලබාදීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 748 | 646 | 102 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 580 | 603 | 12 | 35 |
| | **එකතුව** | **1356** | **1274** | **117** | **35** |